25-09-2025 උදෑසන මුරලි ඕම් ශාන්ති බාප්දාදා මධුබන්

**සාරය:** සුමිහිරි දරුවනි, මෙම නාටකයේ රඟදැක්ම, නිවැරදිව සිදුවනවා. ඕනෑම නියමිත වේලාවකදී, රඟ දැක්වීමට ඇති චරිත කොටසක්, ඒ අනුවම නැවතත් සිදුවෙයි. මෙය නිවැරදිව වටහා ගත යුතුයි.

**ප්‍රශ්නය:** ඔය දරුවන් අන් අය මත බලපෑමක් ඇති කරන්නේ කවදාද? දැනට තවමත් අඩු බලය කුමක්ද?

**පිළිතුර:** ඔබ යෝගාවේ ශක්තිමත් වන විට, ඔබ අන් අය මත බලපෑමක් ඇති කරයි. තවමත් එම බලය නොමැත. සිහිපත් කිරීම තුළින් පමණයි, ඔබට බලය ලැබෙන්නේ. තවමත් අඩු, සිහිපත් කිරීමේ බලය, ඥානයේ අසිපතට අවශ්‍යයි. තමන් ජීවාත්මයක් බව සලකා, දිගින් දිගටම පියාව සිහි කරන විට, ඔබගේ ඔරුවට එතෙර විය හැක. මෙය තත්පරයක කාරණාවක්.

ඕම් ශාන්ති. ආධ්‍යාත්මික පියා මෙතැන අසුන් ගෙන, ඔය ආධ්‍යාත්මික දරුවන්ට විස්තර කරනවා. ආධ්‍යාත්මික පියා ලෙස හැඳින්වෙන්නේ ඒකායන කෙනා පමණක් වන අතර, අන් සියල්ලම ජීවාත්මයි. ඔහුට උත්තරීතර ජීවාත්මය යැයි කියයි. පියා පවසන්නේ මමද ජීවාත්මයක් වන නමුත්, මම උත්තරීතරයි, මම සත්‍යය වෙමි. පාරිශුද්ධකරු මෙන්ම ඥානයේ මහා සයුර වන්නේ මා පමණයි. පියා පවසන්නේ ඔය දරුවන්ව ලෝකයේ අධිපතියන් බවට පත් කරවීම සඳහා මා පැමිණෙන්නේ භාරතයේ පමණයි. ඔබ අධිපතියන්ව සිටියා නොවේද? ඔබට දැන් මෙය සිහි වී තිබේ. බාබා ඔය දරුවන්ට මතක් කරනවා ඔබ පළමුවෙන්ම ස්වර්ණමය යුගයේදී පැමිණ, ඔබගේ උපත් 84 හි චරිත කොටස් රඟ පෑ අතර දැන් අවසානයට ළඟා වී තිබේ. තමන් ජීවාත්ම බව සලකන්න. ජීවාත්ම විනාශ නොවන අතර, සිරුරු විනාශ වන සුළුයි. සිරුරක් තුළින් තවත් ජීවයක් සමඟ කතාබහ කරන්නේ ජීවයක්ය. ඔබ ජීව අවධානයෙන් නොසිටින විට, ඔබ නිසැකයෙන්ම සිටින්නේ ශරීර අවධානයෙන්ය. තමන් ජීවාත්ම බව සෑම කෙනෙකුටම අමතක වී තිබේ. මෙසේ කියැවෙයි පාප ආත්ම, පුණ්‍ය ආත්ම, ශ්‍රේෂ්ඨ ආත්ම. ජීවාත්ම වලට උත්තරීතර ජීවාත්මය විය නොහැක. කිසිම ජීවාත්මයකට, තමන් ශිවා යැයි කිව නොහැක. ඔවුන්ගේ සිරුරු වලට 'ශිවා' යන නම බොහෝ දෙනෙකුට තිබේ. ජීවාත්මයක්, සිරුරකට ඇතුළු වූ විටයි නමක් දෙනු ලබන්නේ, මන්ද ඔහුගේ චරිත කොටස ඔහු රඟ පෑ යුත්තේ සිරුරක් තුළින් නිසා. මේ නිසයි මිනිසුන් ඔවුන්ගේ සිරුරු ගැන අවධානයෙන් සිට, මා 'මේ-මේ-කෙනාය' කියා සිතන්නේ. ඔබට දැන් වැටහෙනවා, 'ඔව්, මා ජීවාත්මයක් වන අතර මා මගේ උපත් 84 හි චරිත කොටස් රඟ පා ඇත.' මට දැන් ජීවාත්ම ගැන වැටහෙනවා. ජීවාත්මය වන මා, සතෝප්‍රධාන්ව සිටි අතර දැන් තමෝප්‍රධාන් වී තිබේ. පියා පැමිණෙන්නේ, රත්තරං වලට වෙනත් ලෝහ මිශ්‍ර කර ඇති සේ, සියලුම ජීවාත්ම මත මල බැඳී ඇති විටයි. මුලදී, ඔබ සැබෑ රත්තරං වන අතර, ඉන්පසුව ඔබ රිදීද, පසුව තඹ සහ ඉන්පසුව යකඩ බවට ඔබ සම්පූර්ණයෙන්ම දුර්වර්ණ වන තෙක් පත්වෙයි. වෙනත් කිසිම කෙනෙකුට මෙම දේවල් විස්තර කළ නොහැක. සෑම කෙනෙක්ම පවසන්නේ ජීවාත්ම, ක්‍රියා වල ඵලයේ බලපෑමට ලක් නොවන බවයි. ඔබ තුළට වෙනත් ලෝහ මිශ්‍ර වන ආකාරය ගැන පියා ඔය දරුවන්ට විස්තර කර දී තිබේ. පියා පවසන්නේ මා පැමිණෙන්නේ භාරතයේ පමණයි. මා පැමිණෙන්නේ, ඔබ සම්පූර්ණයෙන්ම තමෝප්‍රධාන් වූ විටයි. නාටකය, නිවැරදිව රඟ දැක්වෙන ආකාරයෙන්ම, මාද පැමිණෙන්නේ මාගේ නිවැරදි වෙලාවේය. දෙන ලද ඕනෑම නියමිත වේලාවක, රඟ දැක්වීමට නියමිත ඕනෑම කොටසක්, ඒ ආකාරයෙන්ම නැවතත් සිදු වෙයි මෙහි සුළු හෝ වෙනසක් සිදු විය නොහැක. එම නාට්‍ය සීමිත වන අතර, මෙය අසීමිත නාට්‍යයයි. මේ සෑම කරුණක්ම ඉතාමත්ම සියුම් වන අතර, වටහා ගත යුතුයි. පියා පවසන්නේ ඔබ රඟ පෑ කුමන හෝ කොටසක් වීද, එය නාටකයට අනුවම විය. කිසිම මනුෂ්‍යයෙක්, නිර්මාණකරු, හෝ නිර්මාණයේ මුල, මැද හෝ අවසානය ගැන නොදනී. ඍෂිවරු, මුනිවරු පවා, 'නැති, නැති' (මෙයත් නොවෙයි, එයත් නොවෙයි) කියමින් සිටියි. ඔබ නිර්මාණකරු හෝ නිර්මාණයේ මුල, මැද සහ අවසානය ගැන දන්නේද කියා, ඔබගෙන් කෙනෙක් විමසුවොත්, ඔබ විගසින් 'ඔව්' කියා පිළිතුරු දෙයි. කෙසේවෙතත්, ඔබටත් එය දැනගත හැක්කේ මේ කාලයේදී මිස වෙනත් කිසිම කාලයක නොවෙයි. නිර්මාණකරු වන ඔහුව, සහ නිර්මාණයේ මුල, මැද සහ අවසානය ගැන දන්නේ ඔබ පමණක් බව, බාබා විස්තර කර ඇත. අච්චා, එය ලක්ෂ්මි සහ නාරායන්ගේ රාජධානිය වන්නේ කවදාද කියා ඔවුන් දන්නවාද? නැත ඔවුන්ට කිසිම දැනුමක් නොමැත. මෙය විශ්මයකි. ඔබ පවසන්නේ ඔබට ඥානය තිබෙන බවයි. පියාගේ චරිත කොටස රඟ දැක්වෙන්නේ එක් වරක් පමණක්

බවද ඔබ දන්නවා. ඔබගේ අරමුණ සහ ඉලක්කය වන්නේ, ලක්ෂ්මි හෝ නාරායන් බවට පත් වීමටයි. ඔබ එය බවට පත් වූ විට, මෙම ඉගෙනුමට අවශ්‍යතාවයක් නොමැත. ඔබ නීතිඥයෙක් වූ විට, එපමණයි! එබැවින් ඔබට උගන්වන ගුරුවරයාව ඔබ සිහිපත් කළ යුතුයි. ඔහු ඔබට සෑම දෙයක්ම පහසු කර ඇත. බාබා, ඔබට නැවත නැවතත් පවසන්නේ පළමුව, තමන් ජීවයක් බව සලකන්න. මා බාබා සතුයි. පෙර කල, ඔබ අදේවවාදීන්ව සිටි අතර ඔබ දැන් දේවවාදීන්ය. ඔවුන් දේවවාදීන් වූ පසු, ඔබත් දැන් හිමි කරගනිමින් සිටින උරුමය, ලක්ෂ්මි සහ නාරායන් හිමි කර ගත්තා. ඔබ දැන් දේවවාදීන් බවට පත්වනවා. 'දේවවාදීන්' සහ අදේවවාදීන්' යන ව්‍යවහාරය, පවතින්නේ මෙකල පමණයි. එහිදී මෙම ව්‍යවහාර නොපවතී. එහි විමසන්නට ඉතිරි වන දෙයක් නැත. මෙම ප්‍රශ්න මතු වන්නේ මෙහිදීය. එබැවින් ඔබ විමසන්නේ 'ඔබ නිර්මාණකරුව සහ නිර්මාණය දන්නවාද?' එවිට ඔවුන් පිළිතුරු දෙන්නේ 'නැහැ' කියාය. පියාම පැමිණ, ඔහුගේම හැඳින්වීම ලබා දෙන අතර, ආරම්භය, මැද සහ අවසානය පිළිබඳ රහස්‍ද විස්තර කර දෙයි. පියා, අසීමිතත්වයේ අධිපතිය, නිර්මාණකරුය. අනෙත් සියලුම ආගම් ස්ථාපිත කරන්නන්ද අනිවාර්යෙන්ම මෙහි පැමිණෙන බව, ඔය දරුවන්ට පහදා දී තිබේ. ඒබ්‍රහම්තුමා, ක්‍රිස්තුස් වහන්සේ ආදිය පහළට පැමිණෙන ආකාරය පිළිබඳ දර්ශන ඔබට ලබා දෙන ලදී. මෙම හඬ විශාල වශයෙන් පැතිරී ඇති විට, අවසානයේදී ඔවුන් මෙහි පැමිණෙයි. පියා පවසන්නේ දරුවනි, ඔබගේ සිරුරු සහ සියලුම ශාරීරික ආගම් අතහැර, මා සිහි කරන්න. ඔබ දැන් පෞද්ගලිකවම මා ඉදිරියේ අසුන් ගෙන සිටිනවා. තමන් ශරීරයක් කියා සලකන්න එපා. 'මා ජීවාත්මයක්.' තමන් ජීවාත්මයක් බව සලකා, දිගටම පියාව සිහිපත් කරන්න, එවිට ඔබගේ ඔරුව එතෙරට යනු ඇත. මෙය තත්පරයක කාරණයකි. මිනිසුන් විමුක්තිය වෙතට යාම සඳහා, චක්‍රයෙන් භාගයක්ම භක්තියේ යෙදෙති. කෙසේවෙතත්, තවමත් කිසිම ජීවාත්මයකට ආපසු නිවහනට යාමට නොහැක. පියා මෙය වසර 5000 කට පෙර විස්තර කළ අතර, ඔහු දැන් නැවත වරක් එය විස්තර කරනවා. ශ්‍රී ක්‍රිෂ්ණාට මෙම දේවල් විස්තර කළ නොහැක ඔහුට පියා යැයි ඇමතිය නොහැක. පියවරුන්, ලෞකික, අලෞකික සහ පාරලෞකිකයි. ඔබගේ භෞතික පියවරුන්, සීමිතයි. මෙම ලොවට එපිටින් සිටින පියා, අසීමිත පියාය, ඔහු ජීවාත්මයන්ගේ පියා වන අතර, මෙම සංගම යුගයේ පියා, අලෞකික පියා වශයෙන් හැඳින්වෙන, ආශ්චර්යමත් පියාය. කිසිම කෙනෙකුට ප්‍රජාපිතා බ්‍රහ්මාව මතක නැත. ඔහු ඔවුන්ගේ මීමුත්තා බව, ඔවුන්ගේ බුද්ධියට ඇතුළු වන්නේ නැත. ඔවුන් ආදී දේවි සහ ආදම් ආදීන් ගැන කතා කළත්, එය නිකං කට වචනයට පමණයි. දේවාලයේ (දිල්වාලා) ආදී දේවිගේ පිළිරුව තිබේ. ඔබ එහි යන විට එහි තිබෙන්නේ ඔබගේ සිහිවටනය බව ඔබට වැටහෙයි. බාබා එහි අසුන් ගෙන සිටින අතර, අපත් එහි අසුන් ගෙන සිටිනවා. පියා මෙතැන ජීවමාන ස්වරූපයකින් අසුන් ගෙන සිටින නමුත් එහි තිබෙන්නේ අජීවී ප්‍රතිමාය. සිවිලිමේ පෙන්වා ඇති දිව්‍ය ලෝකයද හොඳය. දේවාලය දැක තිබෙන අය, මෙය දන්නවා. බාබා දැන් ජීවමාන ස්වරූපයෙන් අපට රාජයෝගාව උගන්වනවා. එවිට, පසුව, දේවාල ගොඩනැඟෙයි. ඒ සියල්ලම ඔබගේ සිහිවටන බව ඔබගේ බුද්ධියට ඇතුළු විය යුතුයි. අප දැන් ලක්ෂ්මි සහ නාරායන් බවට පත් වනවා. අප පෙරද එය බවට පත් වූ නමුත් ඉන්පසුව අප ඉනිමඟ දිගේ පහළට පැමිණියා. දැන් අප නිවහනට ගොස්, ඉන්පසුව රාමා (පරමාත්ම දෙවියන්) ගේ රාජධානියට ඇතුළු වනවා. ඉන්පසුව රාවනගේ රාජධානිය පැමිණෙන අතර, අප පාපයේ මාර්ගයට යයි. පියා සෑම දෙයක්ම ඉතාමත්ම පැහැදිලිව පහදා දෙයි. මෙකල සෑම මනුෂ්‍යයෙක්ම අපවිත්‍රයි, මේ නිසයි ඔවුන් මෙසේ කන්නලව් කරන්නේ අහෝ පාරිශුද්ධකරුවාණෙනි, පැමිණ අපව පිවිතුරු කරන්න! අපගේ දුක නැති කර, අපට සතුටට මාර්ගය පෙන්වන්න. පරමාත්ම දෙවියන් අනිවාර්යෙන්ම යම් ස්වරූපයකින් පැමිණෙන බව ඔවුන් කියති. කෙසේවෙතත්, ඔහු, බළලෙක්, බල්ලෙක්, වැලි කැටයක් හෝ ගලක ස්වරූපයකින් පැමිණෙන්නේ නැත. ඔහු භාග්‍ය රථයේ පැමිණෙන බව, සිහි කර ඇත. පියාම පවසන්නේ මා මෙම සාමාන්‍ය රථයට ඇතුළු වන්නෙමි. මෙම කෙනා ඔහුගේම උපත් නොදනී. ඔබ දැන් මෙය දන්නවා. ඔහුගේ බොහෝ උපත්වල අවසානයේදී, ඔහු ඔහුගේ විශ්‍රාමික තත්ත්වයට ළඟා වූ විට, මා ඔහු තුළට ඇතුළු වන්නෙමි. භක්ති මාර්ගයේදී ඔවුන් පාණ්ඩවයන්ගේ විශාල ප්‍රතිමා පෙන්වා ඇත. රන්ගුන් වල බුදුන්වහන්සේගේ විශාල ප්‍රතිමාවක් ඇත. මනුෂ්‍යයින් මෙතරම් විශාල විය නොහැක. ඔවුන් දැන් නිර්මාණය කර ඇති රාවනගේ පිළිරුව දැක, ඔය දරුවන් විනෝදයට පත් වනවා ඇති. දිනෙන් දින, ඔවුන් එය තවත් විශාල කරයි. ඔවුන් සෑම වසරකම පුළුස්සා දමන්නේ කුමක්ද? ඔහු සතුරෙක් වන්නට ඇති. පුළුස්සා දමන්නේ සතුරෙකුගේ පඹයෙක් පමණයි. අච්චා, රාවන යනු කවුරුන්ද? ඔබ සෑම වසරකම ඔහුගේ පඹයෙක් පුළුස්සන්නට, ඔහු ඔබගේ සතුරා වූයේ කවදාද? මෙම සතුරා ගැන කිසිවෙක් නොදනී. මෙහි අරුත ගැන කිසිම කෙනෙක් නොදනී. පියා විස්තර කරන්නේ ඔවුන් රාවනගේ සමාජය වන අතර, ඔබ රාමාගේ සමාජයයි. පියා දැන් පවසන්නේ ඔබගේ පවුලේ අය සමඟ නිවසේ වාසය කරන අතර, නෙළුම් මලක් සේ ජීවත් වී, අඛණ්ඩව මා සිහිපත් කරන්න. ඇතැමුන්

විමසන්නේ හංසයින් සහ කොක්කුන් එකට වාසය කරන්නේ කෙසේද? එවිට ගැටුම් ඇතිවෙයි. එය අනිවාර්යෙන්ම සිදුවෙයි. එය දරා ගත යුතුයි. ඒ සඳහා බොහෝ උපක්‍රම තිබේ. පියාට, දක්ෂ විනෝදමත්කරන්නා යැයි කියයි. සැම කෙනෙක්ම ඔහුව සිහි කරයි අහෝ දෙවියනි, අපගේ දුක් වේදනා ඉවත් කරන්න! අපට අනුකම්පා කරන්න! අපව මුදවන්න! සියල්ලන්ගේම මුදවන්නා, වන පියා, ඒකායන ඔහුම පමණයි. ඔබ වෙතට එන ඕනෑම කෙනකුට තනි තනිව විස්තර කරන්න. කරච්චිහිදී ඔබ එක් එක් කෙනා සමඟ වෙන වෙනම අසුන් ගෙන ඔහුට හෝ ඇයට විස්තර කළා. ඔය දරුවන් යෝගාවේදී ශක්තිමත් වන විට, ඔබගේ බලපෑම පැතිරී යයි. තවමත් ඔබට එම බලය නැත. ඔබට ශක්තිය ලැබෙන්නේ සිහිපත් කිරීම තුළින්ය, ඉගෙනුමෙන් නොවෙයි. දැනුමේ අසිපතට, සිහිපත් කිරීමේ බලය අවශ්‍යයි. එම බලය තවමත් අඩුය. පියා ඔබට සෑම දිනෙකම පවසන්නේ දරුවනි, සිහිපත් කිරීමේ වන්දනාවේ රැඳී සිටින්න, එවිට ඔබට බලය ලැබෙයි. ඉගෙනුම තුළින් එතරම් බලයක් ලැබෙන්නේ නැත. සිහිපත් කිරීම තුළින් ඔබ මුළු ලෝකයේම අධිපතියන් බවට පත් වෙයි. ඔබ කරන සෑම දෙයක්ම තමන්ටමයි. බොහෝ දෙනෙක් පැමිණ, ඉන්පසුව පිටව ගියා. මායා බොහෝ බලවත්ය. බොහෝ දෙනෙක් නැවත පැමිණෙන්නේ නැත. මෙම ඥානය ඉතා හොඳ බව ඔවුන් කියා, ඔවුන් සතුටද අත්විඳින නමුත් ඔවුන් පිටතට ගිය පසු සෑම දෙයක්ම අවසන් වෙයි. ඔවුන්ට මෙහි සිටින්නට, මායා ඉඩ දෙන්නේම නැහැ. ඇතැම් අය බොහෝ සතුට අත්විඳියි අහා, බාබා දැන් පැමිණ ඇති අතර අපි අපගේ සතුටු දේශයට යනවා! පියා පවසන්නේ මුළු රාජධානියම තවමත් ස්ථාපිත කර අවසන් නැත. මෙකල, ඔබ පරමාත්ම දෙවියන්ගේ දරුවන් වන අතර, ඉන්පසුව ඔබ දේවතාවන් බවට පත්වෙයි. ඔබගේ අංශක ඉන්පසුව අඩුවෙයි. ලකුණු සටහන් වන්නේ මීටරයකයි ඔබගේ ලකුණු මෙපමණකින් අඩු වී ඇත. ඔබ වඩාත්ම ශ්‍රේෂ්ඨ අය බවට පත් වන අතර, ඉන්පසුව ඔබ පහළට පැමිණෙන විට, ඔබගේ අංශක ක්‍රම ක්‍රමයෙන් අඩු වීගෙන යයි. ඔබ කොහොමත් ඉනිමඟ දිගේ පහළට පැමිණිය යුතුයි. ඉනිමඟ පිළිබඳ දැනුම දැන් ඔබගේ බුද්ධිය තුළ තිබේ. එය ඔබගේ නැඟීමේ තත්ත්වය වන විට, සැම කෙනෙකුටම යහපතක් වෙයි. ඉන්පසුව, ක්‍රම ක්‍රමයෙන් බසින තත්ත්වය ඇතිවෙයි. ඔබ ආරම්භයේ සිටම චක්‍රය ඉතා හොඳින් වටහා ගත යුතුයි. දැන් පියා ඔබ සමඟ සිටින නිසා, මෙය ඔබගේ නැඟීමේ තත්ත්වයයි. මිනිසුන් සර්ව ව්‍යාප්ත බව පවසන පරමාත්ම දෙවියන්, ඔබට දිගින් දිගටම අමතන්නේ 'සුමිහිරි දරුවනි, සුමිහිරි දරුවනි' කියා, එවිට ඔය දරුවන් දිගින් දිගටම කියන්නේ 'බාබා, බාබා!' කියා. අපට ඉගැන්වීමට බාබා පැමිණ සිටියි. ඉගෙන ගන්නේ ජීවාත්මයි, ක්‍රියා සිදුකරන්නේ ජීවාත්මයි. ජීවාත්මයක් වන මා, සාමයේ ප්‍රතිරූවකි. මා මෙම සිරුර තුළින් ක්‍රියා සිදු කරනවා. 'අසාමය' යන වචනය භාවිත කරන්නේ, දුක ඇති විටයි. කෙසේවෙතත්, අපගේ ආදිතම ධර්මය, සාමයයි. බොහෝ ජනයා සිතේ සාමය අයැදියි. ඔහෝ! නමුත් ජීවාත්ම, ශාන්තියේ ප්‍රතිරූ වන අතර ඔවුන්ගේ නිවස වන්නේද ශාන්ත දේශයයි. ඔබට ඔබවම අමතකව ගොසින්ය. ඔබ ශාන්ත දේශයේ වැසියන්ව සිටියා. ඔබට එහිදී ශාන්ත බව ලැබෙයි. මේ දිනවල, ඔවුන් එක් රාජධානියක්, එක් ආගමක් සහ එක් භාෂාවක් තිබීම ගැන කතා බස් කරති එක් වංශයක්, එක් ධර්මයක් සහ එක් දෙවියෙක්. රජයද ලියන්නේ එක් දෙවියෙක් පමණක් සිටින බවයි. එසේ නම්, ඔහු සර්ව ව්‍යාප්ත බව ඔවුන් පවසන්නේ ඇයි? එක් දෙවියෙක් පමණක් ගැන කිසිවෙක් විශ්වාස නොකරයි. එබැවින් ඔබ මෙය නැවතත් ලිවිය යුතුයි. ඔබ ලක්ෂ්මී සහ නාරායන්ගේ පිංතූරය නිර්මාණය කරන විට, එහි මෙසේ ලියන්න ස්වර්ණමය යුගයේ එය ඔවුන්ගේ රාජධානිය පැවති කල්හි, සිටියේ එක් දෙවියෙක් සහ එක් දේවතා ධර්මය පමණයි. කෙසේවෙතත්, මනුෂ්‍යයින්ට කිසිම දෙයක් වැටහෙන්නේ නැත. ඔවුන් එතරම් අවධානයක් යොමු කරන්නේ නැත. අපගේ බ්‍රහ්මණ වංශයට අයත් අය පමණක් අවධානය යොමු කරයි. වෙනත් කිසිම කෙනෙකුට කිසිවක් වැටහෙන්නේ නැත. මේ නිසයි බාබා පවසන්නේ ඔවුන් සමඟ වෙන වෙනම අසුන්ගෙන ඔවුන්ට විස්තර කරන්න. ඔවුන් ලවා පෝරමය පුරවාගන්න, එවිට ඔබට ඔවුන්ගේ විශ්වාස මොනවාද කියා වටහාගත හැකි වෙයි, මන්ද සමහරුන් එක් කෙනෙක්වද තවත් සමහරුන් තව කෙනෙක්වද විශ්වාස කරන බැවින්. ඔබට ඔවුන් සෑම කෙනෙකුටම එකවර විස්තර කළ නොහැක. එක් එක් අය ඔවුනොවුන්ගේ විශ්වාස ගැන ඔබට කියන්නට පටන් ගනීවි. පළමුවෙන්ම, ඔවුන් පැමිණ ඇත්තේ කොහාටද කියා ඔවුන්ගෙන් විමසන්න ඔබ බ්‍රහ්ම කුමාර්, සහ කුමාරි නම කවදෝ හෝ අසා තිබේද? ප්‍රජාපිතා බ්‍රහ්මා ගැන ඔබ සිතන්නේ මොනවාද? ඔබ කවදා හෝ ඔහුගේ නම අසා තිබේද? ඔබ ප්‍රජාපිතා බ්‍රහ්මාගේ දරුවන් නොවේද? අප ප්‍රායෝගික අන්දමකින් මෙය වන්නේය. ඔබත් මෙය වන නමුත් ඔබට මෙය වැටහෙන්නේ නැත. ඔබ නිවැරදි උපක්‍රම භාවිත කරමින් ඔවුන්ට විස්තර කළ යුතුයි. අච්චා.

සුමිහිරි, ආදරණීය, බොහෝ කලක් නැති වී සිට දැන් හමු වුණ දරුවන්ට ඔබගේ මව, පියා, බාප්දාදා සෙනෙහසින් සිහිපත් කර සුබ උදෑසනක් ප්‍රාර්ථනා කරයි. ආධ්‍යාත්මික පියාගෙන් ආධ්‍යාත්මික දරුවන්ට

නමස්කාර.

**ධාරණය සඳහා සාරාංශය:**

1. දේවාල වලට යන විට, ඒවා ඔබගේ සිහිවටන බව සෑම විටෙකම අවධානයේ තබාගන්න. අපි දැන් ලක්ෂ්මී සහ නාරායන මෙන් වනවා.
2. ඔබගේ පවුලේ අය සමඟ ඔබගේ නිවසේ වාසය කරන අතර, නෙළුම් මලක් මෙන් ජීවත් වන්න. හංසයින් සහ කොක්කුන් එකට වාසය කරන විට, ඔවුන් විශාල උපාය කෞෂල්‍යයකින් ජීවත් විය යුතු අතර, බොහෝ සේ දරා ගත යුතුද වනවා.

**වරදානය:** ඔබ කරන සේවයේ එකමුතුකමේ සහ තෘප්තිය පිළිබඳ සහතික ලබා ගැනීමෙන්, සාර්ථකත්වයේ නිරන්තර ප්‍රතිමූර්තියක් බවට ඔබ පත් වේවා.

ඔබ කරන සේවයේ සාර්ථකත්වයේ ප්‍රතිමූර්තියක් වීමට නම්, කරුණු දෙකක් කෙරෙහි අවධානය යොමු කරන්න. එකක් සංස්කාර සමපාත කිරීමෙන් එකමුතුකම වන අතර අනෙක ඔබ තෘප්තිමත් වී අන් අයවද තෘප්තිමත් කිරීමයි. සෙනෙහස සහ ශ්‍රේෂ්ඨත්වය පිළිබඳ නිරන්තර හැඟීම් ඇතිව අන් අය සමඟ සම්බන්ධ වන්න, එවිට ඔබට මෙම සහතික දෙකම ලැබෙනු ඇත. එවිට ඔබ ඔබේ ප්‍රායෝගික ජීවිතයේ පරමාත්ම පියාගේ ප්‍රතිරූපයේ කැඩපතක් බවට පත් වන අතර පරමාත්ම පියා එම කැඩපතෙහි ඔහු සිටින ආකාරයෙන්ම සහ ඔහු කවුද යන්න දෘශ්‍යමාන වන ලෙසින් දිස් වනු ඇත.

**පාඨය:** ඔබගේ ජීවාත්ම අවධානයේ ස්ථිතිය තුළ ඔබව ස්ථාවර කරගෙන ජීවිත පරිත්‍යාගය සිදුකරන්න, එවිට ඔබට බොහෝ ජීවාත්මයන්ගෙන් ආශිර්වාද ලැබෙනු ඇත.

***** ඕම් ශාන්ති *****

**අව්‍යක්ත සංඥාව: දැන් සෙනෙහස් ගින්න දල්වා, ඔබගේ යෝගාව ගිණි කන්දක් මෙන් කරගන්න.**

ඔබ යමක් ගින්නකට දැමූ විට, එහි නම, ස්වරූපය සහ ගුණාත්මකභාවය වෙනස් වේ. එලෙසම, ඔබ පියාගේ සිහි කිරීමේ ගින්නට ඔබව යොමු කළ විට, ඔබ පරිවර්තනය වේ. මනුෂ්‍යයන්ගෙන්, ඔබ බ්‍රහ්මින්වරුන් බවට පත් වන අතර, බ්‍රහ්මින්වරුන්ගෙන්, ඔබ පසුව සුරදූතයන් බවට පත්වේ, ඔවුන් පසුව දේවතාවන් බවට පත්වේ. එවැනි පරිවර්තනයක් සෙනෙහස් ගින්නෙන් සිදු වන්නේ ඔබේ ශරීරය පිළිබඳ කිසිදු අවධානයක් ඉතිරි නොවන විටය. මේ නිසයි ඔබේ ස්මරණය ගිනිකන්දක ස්වරූපයක විය යුත්තේ.